# COMMITTEE FOR PROTECTING RIGHTS OF PRISONERS (GUARANTEE) LIMITED

Reg. No. GL002116121
No. 188, Hulftsdorp Street, Colombo 12, Sri Lanka
Tel : +9471 445 3890 / +9471 425 3518 / 011 2672 7787
Email : cprporg@gmail.com Web : www.cprp.lk


28 ජුලි 2026

නීතිඥ මහේෂ් කටුලන්ද,
සභාපති,
අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාලය,
අංක 40,
03 වන මහළ,
බුත්ගමුව පාර,
රාජගිරිය.

**<u>මීගමුව බන්ධනාගාර ප්‍රචණ්ඩත්වයෙන් පසුව රැඳවියන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ පැමිණිල්ල.</u>**

සභාපතිතුමනි,

මෙම පැමිණිල්ල 2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදහන් වූ සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත යටතේ ඉදිරිපත් කරනු ලබන අතර, 2026 ජුලි 5 වැනිදා සහ 6 වැනිදා සිදු වූ ප්‍රචණ්ඩ ගැටුමට මඳකට පෙර මීගමුව බන්ධනාගාරයේ රඳවා ගනිමින් රජය භාරයේ සිටි පුද්ගලයන් තිදෙනෙකු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳව වේ.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ විස්තර, ඔවුන්ගේ ඥාතීන් සහ ඔවුන්ගේ ඉරණම සහ සිටින ස්ථානය සොයා ගැනීමට ගත් උත්සාහයන් මෙහි අමුණා ඇත.

සිද්ධියෙන් මේ වන විට දින විසි තුනක් (23) ක් ගත වී ඇත. බලධාරීන් මෙම රැඳවියන්ගේ දැනට රඳවා සිටින ස්ථානය පිළිබඳව ඔවුන්ගේ පවුල්වලට කිසිදු නිල තොරතුරක් ලබා දී නැත. එසේම ඔවුන් ජීවතුන් අතර සිටීද නැතහොත් මිය ගොස් ඇත්ද යන්න ද තහවුරු කර නැත.

## වරද

2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදහන් වූ සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ 3(1) වගන්තිය අනුව, ඕනෑම රාජ්‍ය නිලධාරියෙකු හෝ නිල තත්ත්වයෙන් ක්‍රියා කරන ඕනෑම පුද්ගලයෙකු වෙනත් කිසිවෙකු රැඳවීම හෝ වෙනත් ආකාරයකින් නිදහස අහිමි කිරීම සහ එම පුද්ගලයාගේ ඉරණම සඟවා තබා ගැනීම හෝ එම පුද්ගලයාගේ පසුකාලීන හෝ වත්මනේ සිටින ස්ථානය හෙළිදරව් කිරීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ වලංගු හේතුවක් නොමැතිව හෙළිදරව් කිරීමට නොහැකි වීම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදකි.

එසේම එම පනතේ 3(3) වගන්තිය අනුව, යම් ප්‍රධානයකු තමන්ගේ පාලනය යටතේ සිටින්නන් ඉහත ආකාරයේ වරදක් සිදු කරමින් සිටි බවට හෝ සිදු කිරීමට අත්‍යාසන්නව සිටි බවට පැහැදිලිව පෙන්නුම් කරන තොරතුරු දැන සිටීම හෝ එම තොරතුරු සිතාමතා නොසලකා හැරීම එම ප්‍රධානියා සිදුකරන වරදකි.

එසේම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙහිලා හේතු සාධක වූ ක්‍රියාකාරකම් පාලනය කිරීමේ බලය සහ වගකීම දරනු ලැබූ, එවැනි වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය හා සාධාරණ පියවර ගැනීමට අපොහොසත් වූ සේම අදාළ තොරතුරු නීතිය ක්‍රියාත්මක කරන අධිකාරියක් වෙත ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලැබූ, ප්‍රධානියෙකු ද වරදක් සිදුකරයි.

ඉහත වැරදි සඳහා මහාධිකරණය විසින් වරදකරු බව තීරණය කළහොත් වසර 20 ක් දක්වා සිරදඬුවම් හෝ රුපියල් මිලියනයක් දක්වා දඩ මුදල් සහ රුපියල් පන්ලක්ෂයක් දක්වා වන්දි ගෙවිය යුතුය.

## රැඳවියන්ගේ, ඥාතීන්ගේ, නීතිඥයන්ගේ අයිතිවාසිකම් සහ බලධාරීන්ගේ බැඳීම්

පනතේ 16(1) වගන්තිය අනුව නිදහස අහිමි කරන ලද පුද්ගලයෙකුගේ ඕනෑම ඥාතියෙකුට, නියෝජිතයෙකුට හෝ නීතිඥයෙකුට නිදහස අහිමි කරන ලද පුද්ගලයා සිටින ස්ථානය පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය, තවත් ස්ථානයකට මාරු කිරීමේදී මාරුකළ ස්ථානය, මාරුකිරීම පිළිබඳව වගකිවයුතු බලධාරියා, නිදහස අහිමි කරන ලද පුද්ගලයාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු, මරණය සිදු වුවහොත් මරණයේ අවස්ථානුගත කරුණු සහ මරණයට හේතුව සහ දේහයේ ගමනාන්තය දැන ගැනීමේ අයිතියක් ඇත.

පනතේ 15(1 සහ 2) වගන්ති පවසන්නේ කිසිවෙකු රහසිගතව රඳවා තබා නොගත යුතු බවත්; නිදහස අහිමි කරන ලද ඕනෑම පුද්ගලයෙකුට ලිඛිත නීතියෙන් ස්ථාපිත කර ඇති කොන්දේසිවලට පමණක් යටත්ව තම ඥාතීන්, නීතිඥයා හෝ තමා කැමති වෙනත් කිසිවෙකු සමඟ සන්නිවේදනය කිරීමට සහ ඔවුන්ව හමුවීමට අයිතිය ඇති බවත්ය.

15(4) වගන්තිය පවසන්නේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් නිදහස අහිමි කරන ලද පුද්ගලයන්ගේ යාවත්කාලීන නිල ලේඛන හෝ වාර්තා සම්පාදනය කර නඩත්තු කළ යුතු අතර ඒවායේ පුද්ගලයාගේ අනන්‍යතාවය; නිදහස අහිමි කිරීමේ ස්ථානය, නිදහස අහිමි කිරීමේ ස්ථානයට ඇතුළු වූ දිනය හා වේලාව සහ නිදහස අහිමි කිරීමේ ස්ථානයට වගකිවයුතු බලධාරියා; නිදහස අහිමි කරන ලද පුද්ගලයාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු; නිදහස අහිමි කිරීම අතරතුර මරණය සිදු වුවහොත් මරණයේ අවස්ථා සහ හේතුව සහ දේහයේ ගමනාන්තය; නිදහස් කිරීමේ හෝ වෙනත් නිදහස අහිමි කිරීමේ ස්ථානයකට මාරු කිරීමේ දිනය හා වේලාව, පුද්ගලයා මාරු කරන නිදහස අහිමි කිරීමේ ස්ථානයේ ගමනාන්තය සහ මාරු කිරීමට වගකිවයුතු බලධාරියා අඩංගු විය යුතු බවයි.

14(3 සහ 4) වගන්ති පවසන්නේ පුද්ගලයෙකු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ වරදකට ලක්ව ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති විට, නිල පැමිණිල්ලක් නොමැති වුවද නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විමර්ශනයක් කළ යුතු අතර අතුරුදහන් වූ පුද්ගලයා සොයා ගැනීමට සියලු සුදුසු පියවර ගත යුතු අතර, රහසිගතව රඳවා සිටී නම් එම පුද්ගලයා නිදහස් කර ගැනීමටත්, මරණය සිදු වුවහොත් දේහය සොයා ගැනීමට, ගෞරවයෙන් සලකා ආපසු ලබා දීමටත් කටයුතු කළ යුතු බවයි.

අමුණා ඇති විස්තර ඇති රැඳවියන් ("අතුරුදහන් වූ පුද්ගලයන්") 2026 ජූලි 5 වැනිදා ප්‍රචණ්ඩත්වය ආරම්භ වීමට පෙර මීගමුව බන්ධනාගාරයේ භාරයේ සිටි බව තහවුරු කර ඇත. ඔවුන්ගේ පවුල් සහ ඔවුන්ගේ නීතිඥවරුන් සහ නීතිඥවරියන් විසින් නැවත නැවතත් විමසීම් කළද, ඔවුන්ගේ වත්මන් ස්ථානය, තත්ත්වය හෝ ඉරණම පිළිබඳ නිල පිළිගැනීමක් නොමැත. මාරු කිරීම් අතරතුර හෝ පසුව මරණ සිදු වී ඇති බවට විශ්වාසනීය වාර්තා ඇති අතර, රැඳවියන්ට වධහිංසා පැමිණවීම සහ අයහපත් සැලකීම පිළිබඳ බරපතල චෝදනා ද ඇත.

## ඉල්ලීම්

අපි මෙයින් නිල වශයෙන් ඉල්ලා සිටින්නේ අදාළ බලධාරීන් අතුරුදහන් වූ සෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන්ම පහත තොරතුරු වහාම ලබා දෙන ලෙසයි:

1. මීගමුව බන්ධනාගාරයේ ඔවුන්ගේ දිගටම රැඳවීම හෝ එයින් මාරු කිරීමට අණ දුන් බලධාරියා;
2. මීගමුව බන්ධනාගාරයෙන් ඔවුන් ඉවත් කිරීම/මාරු කිරීමේ නිශ්චිත දිනය, වේලාව සහ ස්ථානය;
3. මීගමුව බන්ධනාගාරයෙන් මාරු කිරීමෙන් පසු ඔවුන් රඳවා තබා ඇති පසුකාලීන ස්ථාන සහ කාල පරිච්ඡේද (රෝහල් ඇතුළුව);
4. ඔවුන්ගේ වත්මන් සිටින ස්ථානය, ඔවුන් රඳවා තබා ඇති නිශ්චිත බන්ධනාගාරය හෝ රැඳවුම් ස්ථාන හෝ රෝහල ඇතුළුව;
5. ඔවුන්ගේ වත්මන් සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු;
6. ඔවුන්ගෙන් කිසිවෙකු මිය ගොස් ඇත්නම්, මරණයේ අවස්ථා සහ හේතුව, මරණයට අදාළ ලේඛන සහ ඔවුන්ගේ දේහයේ තත්වය සහ තැන්පත්කර ඇති ස්ථානය;
7. ඔවුන්ගේ වත්මන් රැඳවීම අධීක්ෂණය කිරීමට වගකිවයුතු බලධාරියාගේ අනන්‍යතාවය.
8. ඔවුන් හමුවීමට, කතාබහ කිරීමට ඔවුන්ගේ ඥාතීන්ට නීතිඥයන්ට අවස්ථාව ලබා දීම ට හැකි දිනය, වේලාව සහ ස්ථානය;

අපි තවද පනතේ 14(3) සහ 14(4) වගන්තිවලට අනුකූලව මෙම පුද්ගලයන් අතුරුදහන් වීම පිළිබඳ වහාම ස්වාධීන, අපක්ෂපාතී සහ විනිවිද පෙනෙන විමර්ශනයක් ද ඉල්ලා සිටිමු. විමර්ශනයට වෙනත් බන්ධනාගාර වලට මාරු කිරීම්, මරණ සහ වෛද්‍ය වාර්තා පිළිබඳ සියලු වාර්තා සුරැකීම සහ සාක්ෂිකරුවන් සහ පවුලේ

සාමාජිකයන් තර්ජනවලින් ආරක්ෂා කිරීම සහ සොයාගැනීම් පවුල්වලට සම්පූර්ණයෙන් හෙළිදරව් කිරීම ඇතුළත් විය යුතුය.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් දැඩි කම්පනයට පත්ව සිටින අතර ඔවුන් සිය ආදරණීයයන්ගේ ජීවිත සහ ආරක්ෂාව පිළිබඳවද දැඩි බියෙන් පසුවිවේ. ඒ හේතුවෙන් මෙම පැමිණිල්ලෙන් පැය 24 ක් ඇතුළත හදිසි ලිඛිත ප්‍රතිචාරයක් ඉල්ලා සිටී.

පනතේ 20(1) වගන්තිය යටතේ පනතේ 14, 15 සහ 16 වගන්ති බලාත්මක කිරීම සඳහා පෙත්සමක් මගින් ශ්‍රී ලංකා මහාධිකරණයේ අධිකරණ බලය භාවිතා කිරීමට අපි සූදානම්ව සිටිමු.

ස්තූතියි,



නීතීඥ සේනක පෙරේරා,
විධායක අධ්‍යක්ෂ,
සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුව.

පිටපත්:

1. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
2. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති
3. පොලිස්පති
4. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය
5. බලහත්කාරයෙන් හා අකැමැත්තෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම
6. බලහත්කාරයෙන් අතුරුදහන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව
7. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය

<u>අතුරුදහන් වූ පුද්ගලයන්ගේ විස්තර 2026 ජූලි මස 28 වනදා වන විට</u>

| | | | |
|---|---|---|---|
| **අතුරුදහන් වූ තැනැත්තාගේ නම** | නෙලිගමලාගේ නිශාන්ත ලක්මාල් සිරිනන්ද | රාජේන්ද්‍ර අමලන් ඉන්දික | වෝල්කර් ෆ්ලොරෙන්සියෝ මාර්ටිනෙස් නුනියෙස් (Walquer Florencio Martinez Nuñez) |
| **ස්ත්‍රී පුරුෂ බව** | පුරුෂ | පුරුෂ | පුරුෂ |
| **උපන්දිනය** | [redacted] | [redacted] | [redacted] |
| **අතුරුදහන් තැනැත්තාගේ හැඳුනුම්පත් අංකය හෝ ගුවන් ගමන් බලපත්‍ර අංකය** | [redacted] | නොදනී | Passport/ Venezuelan [redacted] |
| **රැඳවුම් අංකය** | 7264 | 178 | නොදනී |
| **රඳවා සිටි වාටුවේ අංකය** | 8 | 8 | නොදනී |
| **නීතිමය තත්ත්වය** | චූදිත | නොදනී | සැකකරු |
| **ඇප සම්බන්ධ තත්ත්වය** | ඇප අයදුම් කර නැත | ඇප ඉල්ලා ඇත | ඇප ඉල්ලා ඇත |
| **අධිකරණ නඩු අංකය** | [redacted] | නොදනී | [redacted] |
| **අවසන් වරට රැඳවියා සමඟ සම්බන්ධ වූ දිනය සහ විස්තර** | මතකයේ නැත | 20/06/2026 | 03/07/2026 විද්‍යුත්/අතථ්‍ය බන්ධනාගාර සංචාරයක් හරහා |
| **ජූලි 5 දිනෙන් පසු තොරතුරු ලබා ගැනීමට ගත් උත්සාහයන්** | ජූලි 06 වනදා සිට ජූලි 27 වනදා තෙක් රැඳවියා සිටින තැනක් සෙවීමට විවිධ උත්සාහ ගෙන ඇත. ජූලි 06 වනදා මීගමුව බන්ධනාගාරයට ගොස් එහි විමසා සිටියද රැඳවියා පිළිබඳව විස්තරයල් ලබා ගත නොහැකි වී ඇති අතර එතැන් සිට අඹණ්ඩව මීගමුව බන්ධනාගාරයට ගොස් එහි ඇති ලැයිස්තුවල රැඳවියාගේ නම පරීක්ෂා කර ඇත. එහෙත් මීගමුව බන්ධනාගාරයේ සිටින රැඳවියන්ගේ | ජූලි 5 සිදුවීමෙන් පසු ජූලි 6 වනදා සිට ජූලි 27 වනදා දක්වා අඹණ්ඩව මීගමුව බන්ධනාගාරය මීගමුව රෝහල දළුපොත බන්ධනාගාරය සහ කොච්චිකඩේ රැඳවුම් මධ්‍යස්ථානය යන ස්ථාන වලට ගොස් සිය රැඳවියා පිළිබඳව තොරතුරු සෙවූවද ලබා ගත නොහැකි වී ඇත. එසේම මීගමුව බන්ධනාගාරය අසල අලවා තිබූ ලැයිස්තු වල ද රැඳවියාගේ නම දින කිහිපයක් සෙවූවද ඔහුගේ නම සොයාගත නොහැකි වී ඇති | ඉන්දියාවේ වෙනිසියුලාවේ තානාපති කාර්යාලය (ශ්‍රී ලංකාව සම්බන්ධව කටයුතු කරන) බන්ධනාගාර බලධාරීන්ට රැඳවියා රඳවා ඇති ස්ථානය සහ සෞඛ්‍යය පිළිබඳ තොරතුරු ඉල්ලා නිල දුරකථන ඇමතුම් ලබා දුන් බවත් රැඳවියා සමඟ කතා කිරීමට හෝ ඔහුගේ තත්ත්වය පිළිබඳ නිල තහවුරු කිරීමක් ලබා දීමට බන්ධනාගාර නිලධාරීන් තරයේ ප්‍රතික්ෂේප කළ බවත් රැඳවියාගේ ඥාතීන් පවසයි. එසේම බන්ධනාගාර දෙපාර්තුමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | ලැයිස්තුව නම් වූ ලැයිස්තු වලද මීගමුව බන්ධනාගාරයෙන් වෙනත් බන්ධනාගාර වලට මාරුකර යැවූ නම් සහිත ලැයිස්තුව නම් ලැයිස්තු වලද යන එකදු ලැයිස්තුවක හෝ රැඳවියාගේ නම සඳහන්ව තිබී නැත. එසේම මීගමුව බන්ධනාගාරයෙන් ජූලි 16 - 20 අතර දිනකදී කළ විමසීමකදී සඳහන් කර ඇත්තේ රැඳවියා මීගමුව බන්ධනාගාරයේ සිටින බවත් ඔහුව බැලීමට අවස්ථාව ලබා දිය නොහැකි බවත්ය. ඉන් පසුව මීගමුව බන්ධනාගාරයේ තමන් කලක පටන් හඳුනන නිළධාරියෙකුගෙන් මේ පිළිබඳව දුරකථනයෙන් විමසූ විට ඔහු ප්‍රකාශ කර ඇත්තේ දින කිහිපයකට පසුව ඔහු සිටින ස්ථානයක් පිළිබඳව සොයා බැලිය හැකි බවයි. | අතර විවිධ අවස්ථාවල බන්ධනාගාර දෙපාර්තුමේන්තුවටද දුරකථන ඇමතුම් ලබා දුන්න ද රැඳවියා පිළිබඳව විස්තරයක් බලාගත නොහැකි වී ඇත. එසේම නීතීඥවරයෙකු මාර්ගයෙන් රැඳවියාගේ අදාළ නඩුවට ඉදිරිපත් වී රැඳවියා රඳවා සිටින ස්ථානයක් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට උත්සාහ කළද තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත. | අමතා තොරතුරු ලබා ගැනීමට ඥාතීන් උත්සාහ කළ නමුත් තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත. |
| **වෙනත් වැදගත් තොරතුරු** | බන්ධනාගාර ගතවීමට පෙර වකුගඩු සම්බන්ධ රෝගයකින් මෙම අතුරුදහන් පුද්ගලයා පීඩා විඳි අතර ඇතැම් කාලවදී කකුල් ඉදිමීම්ද ඇතිවී ඇත. | නොමැත | බන්ධනාගාර කලබලයෙන් පසු ඔහු අනුරාධපුර බන්ධනාගාරයට හෝ වෙනත් බන්ධනාගාරයකට මාරු කර යවා ඇති බවට සැක කෙරේ. නමුත් තහවුරු කිරීමක් නැත. |
| **තොරතුරු සපයන්නාගේ සම්පූර්ණ නම** | [redacted] | [redacted] | [redacted] |
| **රැඳවියා සමඟ ඇති සම්බන්ධතාවය** | සැමියා | සහෝදරයා | සහෝදරයා |
| **ජාතික හැඳුනුම්පත් අංකය** | [redacted] | [redacted] | [redacted] |
| **ස්ථිර ලිපිනය** | [redacted] | [redacted] | [redacted] |
| **දුරකථන අංකය** | [redacted] | [redacted] | [redacted] |
| **ඊමේල් ලිපිනය** | | | [redacted]m |
| **අතුරුදහන් වූ තැනැත්තාගේ හැඳුනුම්පතේ පිටපත** | [redacted] | [redacted] | [redacted] |

| | | | |
|---|---|---|---|
| අතුරුදහන් වූ තැනැත්තාගේ ඡායාරූපය | [redacted] | [redacted] | [redacted] |
| අතුරුදහන් වූ තැනැත්තාගේ ඡායාරූපය ලබාගත් කාල වකවානුව | [redacted] | [redacted] | [redacted] |

A1 ඇමිණුම